13 OCT 2017
වාරිමාර්ග කළමනාකරණ අංශය

මගේ අංකය :-032/3/3/7
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය.
නීලබැම්ම ව්‍යාපාරය.
සාලියවැව හංදිය.
2017.09.21

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියළුම සාමාජික මහත්ම/මහත්මීන් වෙත.

**<u>2017/2018 මහ - පෙර කන්න රැස්වීම -නීලබැම්ම ව්‍යාපාරය.</u>**

1968 අංක 48 දරණ හා 1994 අංක 13දරණ වාරිමාර්ග (සංශොධිත)පනතේ5 වන වගන්තිය අනුව 2017.09.14 වන පෙ.ව.11.30 ට නීලබැම්ම ව්‍යාපාරයේ පෙර වගා රැස්වීම නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් පවත්වූ අතර එහිදී පහත දින වකවානු හා නීතිරීති තීරණය කර ගත් බව කාරුණිකව දන්වන ලදි.

යෝජිත වගා කාලසටහන.

| කාරණය | පළමු අදියර | දෙවන අදියර | තුන්වන අදියර |
|---|---|---|---|
| 1.වගා කිරීමට යෝජිතප්‍රදේශ | නීලමහා ප්‍රගති වෙහෙරබැදි හා නවෝදය ගොවි සංවිධාන | පැරකුම් ගොවි සංවිධානය | නීලවැලි ගොවි සංවිධානය |
| 2.වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය | අක් 501 | අක් 261 | අක් 319 |
| 3.වගා කිරීමට අපේක්ෂිත බෝග | මාස 3 හා 3 ½ වී සහ වෙනත් සමකාලීන බෝග | මාස 3 හා 3 ½ වී සහ වෙනත් සමකාලීන බෝග | මාස 3 හා 3 ½ වී සහ වෙනත් සමකාලීන බෝග |
| 4.ගොවීන් විසින් පළමු වර ඇළ වේලි සුද්ද කිරීම | 2017.10.05 ට පෙර | 2017.10.10 ට පෙර | 2017.10.15 ට පෙර |
| 5.ගොවීන් විසින් සුද්ද නොකරන ඇළ වේලි ගොවි සංවිධානය විසින් සුද්ද කිරීම | 2017.10.09 ට පෙර | 2017.10.14 ට පෙර | 2017.10.19 ට පෙර |
| 6.ප්‍රථම ජල නිකුතුව | 2017.10.10 | 2017.10.15 (ගිණිපෙට්ටි පාලමේ ඉදිකිරීම් නිම වීමත් සමග) | 2017.10.20 (ගිණිපෙට්ටි පාලමේ ඉදිකිරීම් නිම වීමත් සමග) |
| 7.වී වපුරා පැළ සිටුවා බීජ සිටුවා අවසන් කිරීම | 2017.10.31 | 2017.11.05 | 2017.11.10 |
| 8.මුර ජලය ක්‍රියාත්මක කිරීම | 2017.11.14 | 2017.11.19 | 2017.11.24 |
| 9.ගොවීන් විසින් දෙවන වර ඇළ වේලි සුද්ද කිරීම | 2017.12.26 | 2017.12.31 | 2018.01.05 |
| 10.ගොවීන් විසින් සුද්ද නොකරන ඇළ වේලි ගොවි සංවිධානය විසින් සුද්ද කිරීම | 2017.12.31 | 2018.01.05 | 2018.01.10 |
| 11.අවසන් ජල මුරය | 2018.02.15 | 2018.02.20 | 2018.02.25 |
| 12.අස්වනු නෙලීම ආරම්භය | 2018.01.31 | 2018.02.05 | 2018.02.10 |
| 13.මැද කන්නයේ මු උදු වගාව | 2018.02.10 | | |
| 14. මැද කන්නයේ මු උදු අස්වනු නෙලීම | 2018.04.10 | | |

**1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධිත) පනතේ 11 වන වගන්තියේ 1හා 2 උප වගන්ති අනුව**

**කන්නයට අදාළව සකස් කරන නීති**

- වාරිමාර්ග උප පද්දතිය නඩත්තුව සදහා සංවර්ධන අරමුදලට වගා කරන එක් අක්කරයකින් රුපියල් 250.00 ක දායක මුදල නිලවැලි හා පැරකුම් යන ගොවි සංවිධාන වල ගොවීන් විසින් ලදුපතක් මගින් භාණ්ඩාගාරිකට ගෙවිය යුතු අතර එකී මුදල බැංකු ගත කර නඩත්තු සැළසුමක් සකස් කර මහා සභා අනුමැතියෙන් නඩත්තු කටයුතු සිදු කළ යුතුය.
- නියමිත දිනට ඇළ වෙලි සුද්ද නොකරන ගොවීන්ගෙන් බඹයකට රුපියල් 250.00 ක දඩ මුදලක් ගොවි සංවිධාන විසින් අයකරනු ලැබේ.
- නියමිත දිනට පසු කිසිදු හේතුවක් මත ජලය නිකුත් නොකෙරේ.
- වාරි නිර්මිත වලට හානි කිරීම හා අනවසරයෙන් ජලය ගැනීම සම්බන්ධව වාරිමාර්ග ආඥාපනතට අනුව නීතිමය කටයුතු සිදු කෙරේ.

**වෙනත් කොන්දේසි**

- හැකි සෑම විටදීම වී වගාවේදී පැළ විසුරුම් තාක්ෂණය හා යන්ත්‍ර මගින් පැළ සිටුවීමට පියවර ගත යුතු වේ.
- කාබනික පොහොර භාවිතයට ගොවීන් වැඩි වශයෙන් උනන්දු කෙරේ.
- උස්සාන ගොවි සංවිධාන බල ප්‍රදේශවල කන්නයේ නියමිත දිනවල දී වී වගා කර අස්වනු නෙලීමෙන් පසු නැවත වෙනත් බෝග වගා කිරීමට අවස්ථාව හිමි වුවත් වී වගා කිරීමට ඉඩ දෙනු නොලැබේ.
- කන්නය තුලදී ජල පාලන කටයුතු ජල පාලන කමිටුවක් මගින් සිදු කෙරේ.
- වගා නොකරන ලද ඉඩම් සම්බන්ධ රජය විසින් වරින් වර නිකුත් කර ඇති ගැසට් පත්‍ර සැළකිල්ලට ගෙන නීත්‍යානුකූලව කටයුතු කෙරේ.
- ඇළ ඉවුරු වලට පූර්ණ වල්නාශක යෙදීම සපුරා තහනම් වන අතර එහි දඩය බඹයකට රුපියල් 250.00 කි. අවශ්‍ය විටකදී කන්න රැස්වීමේ තීරණ විශේෂ ව්‍යාපාර කළමනාකරණ කමිටුවක් කැදවා එමගින් යෝජනා සකස් කර ප්‍රාදේශීය ලේකම් අනුමැතිය ලබා ගැනීම
- අයාලයේ යන ගවයින් සම්බන්ධ නීතිමය කටයුතු කිරීමේ බලය ගොවිජන සංවර්ධන පනත යටතේ අදාල නිලධාරීන් විසින් සිදු කළ යුතුය..
- කන්න රැස්වීමේ තීරණ කඩකරනු ලබන කවරහෝ අවස්ථාවකදී ගොවිජන සංවර්ධන පනත ඇතුළු අදාල අනෙකුත් පනත් සැළකිල්ලට ගෙන නීතිමය කටයුතු කෙරේ.

ඉහත වගා සැළැස්ම කන්න රැස්වීමට ඉදිරිපත් කිරීම ට සුදුසු බවට පැරකුම් ගොවි සංවිධානයේ ගරු සභාපති එම්. සුනිල් ශාන්ත මහතාගේ යෝජනාවෙන් හා ප්‍රගති ගොවි සංවිධානයේ ගරු සභාපති එච්. පී. අජිත් කුමාර මහතාගේ ස්ථිරත්වයෙන් තීරණය විය.

...........................................

එච්.එම්. දිසානායක
නේවාසික ව්‍යාපාර කළමනාකරු(වැ.බ)
නීලබැම්ම ව්‍යාපාරය

පිටපත් .- 1.අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය (කා.දැ.පි)
2. ප්‍රාදේශීය ලේකම් කරුවලගස්වැව (කා.දැ.පි හා කන්න රැස්වීමට සහභාගිවීම සදහා )
3.වාරිමාර්ග අධ්‍යක්ෂ පුත්තලම (කා.දැ.පි)
4. නියෝජ්‍ය කෘ. අධ්‍යක්ෂ අ.ප.කාර්යාලය අනුරාධපුරය (කා.දැ.පිහා කන්න් රැස්වීමට සහභාගිවීමට)
5.ගොවිජන සේවා ස.කොමසාරිස් හලාවත (කා.දැ.පි)
6.වාරිමාර්ග ඉංජිනේරු පුත්තලම (කා.දැ.පිහා කන්න රැස්වීමට සහභාගිවීමට)
7.ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරී සාලියවැව (කා.දැ.පිහා කන්න රැස්වීමට සහභාගිවීමට)
8.මූලස්ථාන කෘෂිකර්ම උපදේශක (කා.දැ.පිහා කන්න රැස්වීමට සහභාගිවීමට)
9.සහකාර අධ්‍යක්ෂ කෘෂිරක්ෂණ මණ්ඩලය හලාවත (කා.දැ.පි)
10. පොලිස් ස්ථානාධිපති සාලියවැව (කා.දැ.පි හා කන්න රැස්වීමට සහභාගිවීම සදහා )